<u>පැස්බර වත</u>

කපිල පීරිස් මහතා තමාට අවශ්‍ය වූ විට තවමත් තමා මගේ ශිෂ්‍යයකු ලෙස සලකන බව මගේ විශ්වාසය ය. එයට හේතුව ඔහු එසේ නොමැති යැයි තවමත් විදුසර පුවත්පතෙහි සඳහන්කර නො තිබීම ය. එහෙත් ඉන් කියැවෙන්නේ මා ඔහු මගේ ශිෂ්‍යයකු ලෙස සලකන බව නො වේ. එමෙන් ම ඉන් කියැවෙන්නේ කපිල පීරිස් මහතා සියළු අවස්ථාවල තමා මගේ ශිෂ්‍යයකු ලෙස සලකන බව ද නො වේ. මා වරක් මේ විවාදයෙහි දී ඔහු මගෙන් ඉගෙන ගත් දෙයක් නොමැති බව කියා ඇති බව සඳහන් කෙළේ ය. ඔහු එය විශේෂ සන්දර්භයක වූවක් යැයි කීවේ ය. කන්න ඕන උනාම කබරගොයා තලගොයා කරගැනීමට කපිල පීරිස් මහතා සමතෙකි.

මෙය විවාදයක් මිස කපිල පීරිස් කුහක වතට අනුව කෙරෙන හුදු අදහස් දැක්වීමක් නො වේ. ඒ බව කපිල පීරිස් මහතා ඔක්තෝබර් 28 වැනි දා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය හා කොහෙද යන්නෙ මල්ලෙ පොල් යන ලිපියෙන් ද පැහැදිලි වෙයි. තරක කරන්නේ නැතැයි කියමින් තරක කිරීම කුහක වතක් නො වේ ද? එහෙත් ඒ බව කීම ඒ මහතාට අනුව යන්නෙ කොහෙද මල්ලෙ පොල් පිළිතුරකි. මා සැම විටම ඔහුට පිළිතුරු දී ඇත්තේ ඔහුගේ ලිපිවලින් වාක්‍යයක් හෝ වාක්‍ය කිහිපයක් හෝ උපුටා දැක්වීමෙන් පසුව ය. පිළිතුර සැමවිට ම ඒ උපුටා දැක්වූ කොටසට අදාළ ය. එසේ නැතිව කොහෙද යන්නෙ මල්ලෙ පිළිතුරු එහි නැත.

අපි ඔහුගේ ඔක්තෝබර් 28 වැනි දින ලිපියෙන් උපුටා දක්වමු. “අපේ ඉංජිනේරු සම්ප්‍රදාය ලිපි නිවන අරමුණු කරගත් සමාජයකට අදාළ ලෞකික කටයුතු සඳහා වන රාමුව යම්තමින් හෝ එළිපෙහෙළි කර ගැනුම සඳහා ය. එසේ නොමැතිව ඒවා ලියැවෙන්නේ නලින් ද සිල්වා මහතාගේ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයට ගැලපෙන පරිදි නො වේ. ඒ මහතාගේ එම මතවලට අනුව අප ගේ ලිපි අද බාල ය, මුග්ධ ය, ද්‍රෝහි ය, කුහක ය.” කපිල පීරිස් මහතා තම ලිපි පෙළ පළමුවෙන් ලියන විට එහි තිබුණේ ඔහු කියන අපේ ඉංජිනේරු සම්ප්‍රදාය එළිපෙහෙළි කරගැනීමේ අරමුණ ය. ඉන් පසු ඔහුත් නොදන්නා ඒ රිනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය අපේ සංවර්ධනය සමග එකට එකතුකර කීවේ ය. දැන් ඔහු නිවන ද එයට එකතු කරයි.

සිංහල බෞද්ධයන් නිවන අරමුණු කරගත් පිරිසකි. එවැනි පිරිසකගේ සමාජයක ලෞකික කටයුතු කිරීම හා දැනුම නිර්මාණය කරන්නේ කිනම් චින්තන පසුබිමක යන්න ද නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙහි විස්තර කෙරෙයි. සාමාන්‍යයෙන් මගේ ගණිත දේශනවලට සහභාගි වූ අය ද එවැනි දේ අසති. එහෙත් ඔවුහු සියළු දෙනා ම මගේ ශිෂ්‍යයෝ නො වෙති. ඔවුහු ඒ කිසිවක් විශ්වාස නො කරති. කපිල පීරිස් මහතා තම ලිපි ලියන්නේ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයට ගැලපෙන පරිදි නොවේ යැයි කියන විට ඉන් අදහස්වන්නේ ඔහු මූලික වශයෙන් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය නොපිළිගන්නා බව ය. නිව්ටන් දැනුම නිර්මාණය කර ඇත්තේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි යන්නත් ඉන් රිනියා යථාර්ථය දෙවියන් වහන්සේ ආදිය වෙන්කළ නොහැකි බවත් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙන් කියැවෙයි. කපිල පීරිස් මහතා ඒ නොපිළිගන්නා බව පැහැදිලි ය. ඔහු තම පළමු ලිපිවල සඳහන් කෙළේ නිව්ටන්ගෙන් යථාර්ථය දෙවියන් වහන්සේ ආදිය ඉවත්කර නිව්ටෝනීය සංකල්ප යොදා ගැනීමට හැකි බව ය. ඒ කළ නොහැකි බව මම පැවසුවෙමි. එසේ කෙළේ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙහි සිට ය. කපිල පීරිස් මහතා එසේ වෙන්කළ හැකි යැයි කියන්නේ කිනම් පදනමක සිට ද?

ඔහු නිර්මාණාත්මක සාපේක්ෂතාවාදී අදහස් නොපිළිගන්නේ නම්, තම අදහස් හා තරක විතරක ඉදිරිපත් කරන්නේ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදී අදහස්වලට ගැලපෙන පරිදි නො වේ නම් නිව්ටන්ගෙන් රිනියා යථාර්ථය ඉවත්කිරීමේ ප්‍රශ්නය ඔහුට පැන නගින්නේ කෙසේ ද? ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය, යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය බටහිර දැනුම නිර්මාණයේ දී පදනම්වන්නේ යැයි අපි කියමු. අප එසේ කියන්නේ කට කහනවට නොව ඒ පිළිබඳ උදාහරණ ද සැපයීමෙන් පසුව ය. මුළු මහත් බටහිර විද්‍යාව ම ක්‍රිස්තියානි විද්‍යාවක් යැයි අප සරළව කියන්නේ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය අනුව ය. කපිල පීරිස් මහතා අපේ පැරණි දැනුම් පැහැදිලි කිරීමට නිව්ටන්ගේ සංකල්ප යොදාගන්නේ මෙරට බොහෝ අය අපේ දැනුම් තේරුම් කිරීමට බටහිර දැනුම යොදාගන්නා ආකාරයට නම් අපට කපිල පීරිස් මහතා සමග ඇත්තේ වෙනත් ප්‍රශ්නයකි. එවිට අප එයට විරුද්ධවන්නේ පඬියන් බුදුදහම විද්‍යාත්මක කරන විට එයට

© Prof. Nalin De Silva

විරුද්ධවන ආකාරයට ය. එහෙත් කපිල පීරිස් මහතා දැන් කුමක් කීව ද ඔහු නිව්ටන්ගේ ලෝකයෙන් නිව්ටන් මුදාගැනීමට තැත්කරන්නේ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදී අදහස්වලට එකඟව ය.

නිව්ටන්ගේ ලෝකයෙන් නිව්ටන් මුදාගැනීම, නිව්ටන්ගේ ලෝකයෙන් මුදාගත් නිව්ටන් ආදිය කපිල පීරිස් මහතාගේ ප්‍රකාශ ය. ඒ මහතා එවැනි ප්‍රකාශකරන්නේ නිව්ටන්ගේ ලෝකයක් ගැන කියමිනි. ඒ අතර ඔහුට නිව්ටන්ගේ ලෝකයක් ගැන කියාදීම පිළිබඳ ව මට පිං දෙයි. නිව්ටන්ගේ ලෝකය යන්න ම නිර්මාණාත්මක සාපේක්ෂතාවාදී අදහසකි. කපිල පීරිස් මහතා ඒ යොදා ගනියි. එහෙත් ඒ අතර ඔහු කියන්නේ තමා තම ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදායක් ගැන ලිපි ලියන්නේ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයට ගැලපෙන පරිදි නොවන බව ය. මේ කන්න ඕන උනාම කබරගොයා තලගොයා කරගන්නා පිළිවෙත කුහක පිළිවෙතක් බව මම නැවතත් කියමි. ඒ අතර ඔහු විද්‍වසර පාඨකයන් නොමග යැවීමට තැත්කිරීමෙන් ද අපේ දැනුම බටහිරටන්ට අවශ්‍ය වන ආකාරයට තේරුම් කිරීමෙන් ද  අපේ දැනුමට ද්‍රෝහි වෙයි. එවැනි ප්‍රකාශ කපිල පීරිස් මහතාට ප්‍රියජනක  නොවන බව මම දනිමි. එහෙත් ඔහුගේ ස්වරූපය විද්‍වසර පාඨකයනට හෙළිදරව් කළ යුතු වෙයි.

මෙහි දී මෙතෙක් නොකියැවුණු තවත් කරුණක් කිව යුතු ය. කපිල පීරිස් මහතා නිව්ටන්ගේ ලෝකයෙන් මුදාගත් නිව්ටන්ගේ නියමවලින්. සංකල්පවලින්, ප්‍රවාදවලින් තම ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය ගැන කියනවිට ඒ තේරුම් කරන විට ඒ හෙළිපෙහෙළි කරන විට ඔහු ඉලක්ක කරගත් පිරිස් ඒ ගැන සිත් යොමු කරන්නේ මේ නිව්ටන්ගේ ලෝකයෙන් මුදාගත් නිව්ටෝනීය නියම සංකල්ප ආදී වශයෙන් කල්පනා කරමින් ද? ඔහු ඉලක්ක කරගන්නා දෙපිරිසක් ගැන කියයි. එක් පිරිසක් ගැමියන් ය. අනෙක් පිරිස නිලධාරීන් ය. ගැමියන් ගැන ඔහු කියන දේ කොපමණ පරස්පර සහිත දැයි මම පසුගිය සතියේ ලිපියෙන් පෙන්වා දුන්නෙමි. ඒ පරස්පර පැත්තකට දමමු. මේ ගැමියෝ නිව්ටන්ගේ ලෝකයෙන් මුදාගත් නිව්ටෝනීය සංකල්ප, ප්‍රවාද නියම ආදිය ගැන දනිත් ද? ඔවුන්ට නිව්ටෝනීය සංකල්ප යනු නිව්ටෝනීය සංකල්ප මිස නිව්ටන්ගේ ලෝකයෙන් මුදාගත් නිව්ටෝනීය සංකල්ප නො වේ. ඔවුන්ට බටහිර විද්‍යාව යනු බටහිර විද්‍යාව මිස නිව්ටන්ගේ ලෝකයෙන් මුදාගත් බටහිර විද්‍යාවක් නො වේ. කපිල පීරිස් මහතා මේ කතාවලින් විද්‍වසර පාඨකයන් මුළාකිරීමට උත්සාහ ගනියි. ඒ වංචාවක් මිස අනෙකක් නො වේ.

අනෙක් අතට අර නිලධාරීන් ගැන කිවහැක්කේ කුමක් ද? ඔවුහු නිව්ටන්ගේ ලෝකයෙන් මුදාගත් නිව්ටෝනීය නියම, සංකල්ප ප්‍රවාද ආදිය ගැන දනිත් ද? ඔවුන් පාසලේ දී හෝ විශ්වවිද්‍යාලයේ දී හෝ ඒ දෙතැනම හෝ ඉගෙන ගන්නේ නිව්ටෝනීය නියම හා ප්‍රවාද ගැන මිස නිව්ටන්ගේ ලෝකයක් ගැන නො වේ. ඔවුහු බොහෝ දෙනා නිව්ටන්ගේ ලෝකයක් ගැන නො දනිති. ඔවුන්ට ඊනියා යථාර්ථයෙන් වෙන්කරගත් නිව්ටෝනීය ප්‍රවාද හා සංකල්ප නැත. එසේ කිරීමක් ගැන කියන්නේ කපිල පීරිස් මහතා (හා ඔහුගේ මිතුරන් පිරිසක්) පමණකි. කපිල පීරිස් මහතා ඒ බව ගැමියන්ට හෝ නිලධාරීන්ට හෝ කියන්නේ ද? එසේ කීව ද ඔවුහු ඒ කතා පිළිගනිත් ද? මේ නිලධාරීහු නිව්ටෝනීය යථාර්ථයෙහි තෙම්පරාදු වූවෝ වෙති. ඔවුන්ට යථාර්ථයෙන් තොර නිව්ටෝනීය ප්‍රවාද නැත. ඒ නිලධාරීන්ට ඒ බව දැනගැනීමට නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය දැනගත යුතු නො වේ. ඒ නිලධාරීන් තමන්ට සාපේක්ෂව ලෝකය ග්‍රහණය කරගන්නේ ඒ පරිදි ය. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙන් කෙරෙන්නේ එකිනෙකා තම තමන්ට සාපේක්ෂව ලෝකය ග්‍රහණය කරගන්නේ, එනම් නිර්මාණය කරගන්නේ කෙසේ ද යන්න සිංහල බෞද්ධ චින්තනයට සාපේක්ෂව පැහැදිලි කරදීම ය.

අප කලින් ලිපියක කියා ඇති පරිදි තම ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය නිව්ටන්ගේ ලෝකයෙන් මුදාගත් නිව්ටෝනීය සංකල්පවලින් පැහැදිලි කරදෙන්නෙමි යි කියමින් කපිල පීරිස් මහතා කරන්නේ ඒ නිලධාරීන්ට ඊනියා යථාර්ථය තව තවත් තහවුරු කරගැනීමට අවශ්‍ය ඉන්ධන සපයා දීම පමණ ය. කපිල පීරිස් මහතා සැබවින්ම අපේ දැනුම බටහිර විද්‍යාවෙන් තේරුම් කරදෙන්නන්ගෙන් වෙනස් වෙයි. ඒ අනෙක් අය එසේ කරන්නේ බටහිර විද්‍යාවට වැඳ වැටෙමිනි. කපිල පිරිස් මහතා ද එසේ කරන්නේ වැඳ වැටෙමිනි. එහෙත් එසේ වැඳ වැටෙන අතර ඔහු කියන්නේ පිස්සුද මා මේ වඳිනවා නෙවෙයි වඳින්නන් වැඳීමෙන් ගලවාගැනීමට උත්සාහ කරනවා පමණක් බව ය.

කපිල පීරිස් මහතා ඔක්තෝබර් 28 වැනි දින ලිපියෙන් ඔහු ද නොදන්නා තම ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය ලිපි ගැන කරුණු හතරක් ඉදිරිපත් කරයි. එහි පළමුවැන්න ඔහුගේ වචනවලින් ම මෙසේ ය. “අපේ පැරණි ඉංජිනේරු

© Prof. Nalin De Silva

(සංවර්ධන) සම්ප්‍රදායේ, නිව්ටන්ගේ ලෝකයෙන් මුදාගත්, නිව්ටන්ගේ නියමවලින් පැහැදිලි කළ හැකි කොටස් පැහැදිලි කරගැනීම.'' මෙය අමූලික බොරුවක් බව මේ වන විට පාඨකයනට අවබෝධ වන්නට ඇතැයි සිතමි. පළමුවෙන් ම නිව්ටන්ගේ ලෝකයෙන් නිව්ටන්ගේ නියම මුදාගැනීමට නො හැකි ය. නිව්ටන්ගේ ලෝකයෙන් මුදාගත් නිව්ටන්ගේ නියම යනුවෙන් නියම ඇත්තේ කපිල පීරිස් මහතාගේ හා ඔහුගේ අදහස් අනුමත කරන්නවුන්ගේ අර නැති නොවී පවතින ඇති මනසේ විය යුතු ය. මේ මනස ඉතා වටිනා මනසක් බව කිවයුතු නො වේ. පරිනිර්වාණයෙන් පසුව ද මේ මනස පවතියි. එවැනි සුවිශේෂ මනස්වල නිව්ටන්ගේ ලෝකයෙන් මුදාගත් නිව්ටන්ගේ නියම ප්‍රවාද සංකල්ප ආදිය පැවතිය හැකි යැයි සිතන්නට මම ද පෙළඹෙමි.

දෙවැනුව මේ ඉංජිනේරු සම්ප්‍රදාය කුමක් ද? කපිල පීරිස් මහතා මුල් ලිපිවල අපේ ඉංජිනේරු සම්ප්‍රදායක් පමණක් ගැන කියවිණි. එහෙත් පසුව ඔහු සංවර්ධනය යන්න ද එයට එකතු කෙළේ ය. එසේ කෙළේ ද බොහෝ විට වරහන් තුළ ය. කපිල පිරිස් මහතාට පසුව තමන් කියන්නේ කුමක් ද යන්න පිළිබඳ ව යම් සැකයක් ඇති වී වරහන් තුළ සංවර්ධනය එකතු කර ඇති බව පෙනෙයි. කපිල පිරිස් මහතා තම ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය සංවර්ධනය සමග ගැටගසන්නේ ඇයි? අපේ ඉංජිනේරු සම්ප්‍රදාය පමණක් නොව වෛද්‍ය සම්ප්‍රදාය ද දාර්ශනික හා විද්‍යා සම්ප්‍රදාය ද අපේ සංවර්ධනය සමග බැඳී තිබෙන බව අපි ද කියමු. මේ සියල්ල එකිනෙකට බැඳී තිබෙන බවත් එසේ බැඳී ඇත්තේ චින්තනය ඔස්සේ බවත් අප කිය ඇත්තේ වරක් දෙවරක් නො වේ. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ ඒ බව කියැවෙයි. එහෙත් කපිල පිරිස් මහතා තම ඊනියා ඉංජිනේරු සම්ප්‍රදාය සමග සංවර්ධනය අමුණන්නේ ඔහු තම ඊනියා ඉංජිනේරු සම්ප්‍රදාය කුමක් දැයි නොදත් බැවින් හා ඔහුගේ ගැලවීමට අපේ සංවර්ධනය අවශ්‍ය වී තිබෙන නිසාත් ය.

ලබන සතියේ ඔහුගේ ලිපිවලින් ඔහුගේ වචනවලින් ම ඔහු තම ඊනියා ඉංජිනේරු සම්ප්‍රදාය නොදන්නා බවට කරුණු ඉදිරිපත් කරමු. මේ ලිපි පෙළ දිරඝවීම ගැන කණගාටුවන අතර එසේ වීමට හේතුව කපිල පීරිස් මහතා කරන උගුරට හොරා බෙත් කෑම ය. තමා සඳහන් කරන ඊනියා ඉංජිනේරු සම්ප්‍රදාය යනු කුමක්දැයි නොදන්නා ඒ මහතා අපේ සංවර්ධනයෙහි සැඟ වී තම නොදැනුවත්කම වසාගැනීමට තැත්කරන්නේ පැස්බර වතිනි. වැල්ලේ සැඟවීමට උත්සාහ කරන පැස්බරා තම සිරුර සැමට ම ප්‍රදර්ශනය කෙරෙන බව නො දනියි. කපිල පීරිස් මහතාගේ විමසුමට පසුගිය සතියේ ලක් වූ බයිසිකලය  කපිල පීරිස් මහතාගේ තම ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදායට අයත් නොවන බව පැහැදිලි ය. ඔහු කියනු ඇත්තේ ඒ ඇසුරෙන් ත්‍රිරෝද හා වෙනත් වාහන නිපදවීමක් ගැන කතාකරන බව ය. ඒ කෙසේ වෙතත් බයිසිකලයේ ද ඊනියා අපේ සංවර්ධනයක් ඇති බව කපිල පීරිස් මහතාට කීමට හැකි ය. අපේ සංවර්ධන රටාව අපත් තවත් අයත් දැන් අවුරුදු විසිපහක කාලයක් තිස්සේ සාකච්ඡා කරමු. ඒ පිළිබඳ ලියැවුණු ලිපි හා පොත්පත් රාශියක් වෙයි. ඒ දැනුම කපිල පිරිස් මහතාගේ ඊනියා අපේ ඉංජිනේරු සම්ප්‍රදායක් සමග පටලවා ගත යුතු නො වේ. අපේ සංවර්ධන රටාව දැනගත් පමණින් ඒ සමග බැඳී තිබුණ ද අපේ ඉංජිනේරු සම්ප්‍රදාය දැනගත හැකි නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva